**ලංකා හොස්පිටල් කෝපරේෂන් පීඑල්සී සමාගම - 2017**

---

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරිමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා හොස්පිටල් කෝපරේෂන් පීඑල්සී සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන සහ සමාගම හා එහි පරිපාලිතයෙහි (සමූහය) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය ") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මතය

-------------

සමාගම විසින් 2017 ජුනි 28 දින පවත්වන ලද වාර්ෂික මහා සභා රැස්වීමේ දී පෞද්ගලික විගණන සමාගමක් වන කේපීඑම්ජී (වරලත් ගණකාධිකාරී) සමාගම පත්කර ඇති බැවින්, ලංකා හොස්පිට්ල් කෝපරේෂන් පීඑල්සී සමාගමේ විගණන මතය කේපීඑම්ජී සමාගම විසින් නිකුත් කරන ලදි. කේපීඑම්ජී සමාගම විසින් හැර මතයක් 2018 මාර්තු 28 දින නිකුත් කර තිබුණි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

--------------------------------------------------

#### 2.2.1 සාක්ෂි නොමැති වීම

--------------------------------

රු.39,010,453 ක් වූ ණයගැතියන් හා රු.25,451,099 ක් වූ ණයහිමියන්ගේ නිවැරදිභාවය හා පැවැත්ම, ඍජු තහවුරු කිරීම් නොමැතිවීම හේතුවෙන් විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

### 2.3 නොසැසඳු ශේෂයන්

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ණය හිමියෙකුට ගෙවිය යුතු ලෙස රු.12,941,033 ක් ලෙජර ගිණුමෙහි දක්වා තිබුණ ද, අදාල ණය හිමියා විසින් තහවුරු කරන ලද ශේෂය රු.41,212,069 ක් විය. එබැවින් රු.28,271,036 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ණයගැතියෙකුගෙන් ලැබිය යුතු ලෙස රු.49,911,604 ක් ලෙජර් ගිණුම්වල දක්වා තිබුණ ද, අදාළ ණයගැතියා විසින් තහවුරු කරන ලද ශේෂය රු.49,815,576 ක් වූයෙන් රු.96,028 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) 2017 දෙසැම්බර් 31 දිනට පෙරගෙවුම් ලෙජර ශේෂය රු.66,678,662 ක් වුව ද උපලේඛණය අනුව එය රු.59,927,474 ක් වූයෙන් රු.6,751,188 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඈ) මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනට ඊ- චැනල් විකුණුම් මගින් ලැබිය යුතු ශේෂය රු.5,738,910 ක් වුවද, රෝහල් තොරතුරු පද්ධතිය අනුව එය රු.5,771,762 ක් වූයෙන් විගණනයේදී රු.32,852 ක වෙනසක් නිරීක්ෂණය විය.

## 2.4 දීර්ඝ හිඟ ප්‍රතිපාදන

එකතුව රු.3,859,683 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු හා අත්තිකාරම් ශේෂ දීර්ඝ කාලයක සිට නිරවුල් නොකර ඉදිරියට ගෙනවිත් තිබුණි.

## 2.5 නොසැසඳුනු විගණන කරුණු

සමාලෝචිත වර්ෂය තුලදී සේවය ලබාගන්නා ලද ඇතැම් විශේෂඥ ක්ෂේත්‍රයන්හි උපදේශකවරුන් සඳහා වූ ක්‍රමෝපායික වෛද්‍ය ගෙවීම් ලෙස රු.99,300,000 ක් සමාගම විසින් ගෙවා තිබුණු අතර එකී අදාළ ක්ෂේත්‍රයේ විශේෂඥ වෛද්‍යවරුන් සහිත කාර්ය මණ්ඩලයක් සමාගම සතුව පැවතුණි.

සභාපතිවරයා මෙම ගැටළුව සම්බන්ධයෙන් අදහස් දක්වා තිබුණු අතර ඔවුන් පූර්ණ කාලීන සේවකයන් ලෙස බඳවා ගැනීමට රෝහලට අවශ්‍ය වන්නේ නම්, ආයතනයට වඩා වැඩි පිරිවැයක් දැරීමට සිදුවනු ඇති බව දන්වා තිබුණි. රෝහල් කාර්ය මණ්ඩලය උපදේශකවරුන් පස් දෙනෙකුගෙන් සමන්විත වූ අතර එක් ශල්‍ය වෛද්‍යවරයෙකු, විකිරණවේදීන් දෙදෙනෙකු හා නිර්වින්දන වෛද්‍යවරු දෙදෙනෙකු ඊට ඇතුළත්ය. වෛද්‍ය ක්ෂේත්‍රය තුළ සිටින විශේෂඥ වෛද්‍යවරුන් හා ලංකා හොස්පිටල් මගින් සේවය ලබාගන්නා රෝගීන් සංඛ්‍යාව පිළිබඳව සලකා බැලීමේදී, සේවක පඩි ලැයිස්තුව තුළ සඳහන් එකම ශල්‍ය වෛද්‍යවරයා විසින් පමණක් මෙම ශල්‍යකර්ම සිදුකළ නොහැක. නිර්වින්දන වෛද්‍යවරුන් හා විකිරණවේදීන් ප්‍රධාන උපදේශකවරුන්හට සහය දෙනු ලැබේ. මෙම උපදේශකවරුන් මගින් 2017 වර්ෂයේදී රෝහල උපයාගත් මුළු ආදායම රු.බිලියන 1.29 කි.

## 2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පීඊඞී 1/2015 දරන පොදු ව්‍යාපාර චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව, සමාගම විසින් ප්‍රධාන විධායක නිලධාරියා සහ ප්‍රධාන මෙහෙයුම් නිලධාරියා/ ප්‍රධාන මූල්‍ය නිලධාරියා වෙත සීමාව ඉක්මවා පිළිවෙලින් ලීටර් 50 ක් හා ලීටර් 35 ක් සඳහා ඉන්ධන දීමනා ගෙවා තිබුණි.
කෙසේ වුවද, සමාගමෙහි අනෙකුත් සම වර්ගයන්හි ප්‍රමාණයන් හා වෙනත් පොදු ලැයිස්තුගත සමාගම් විසින් ඉදිරිපත් කළ ප්‍රමාණයන් හා සම විය යුතු ඉන්ධන ද ඇතුලුව මුළු පාරිශ්‍රමිකය පිළිබඳව ඉල්ලුම්කරුවන් හා සාකච්ඡා කළ බව සභාපතිවරයා දන්වා තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ හා සමූහයේ මෙහෙයුම් ප්‍රතිඵලය පිළිවෙලින් රු. 834,876,233 ක් හා රු.922,047,400 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ සමාගමෙහි හා සමූහයේ බදු පෙර ශුද්ධ ලාභය පිළිවෙලින් රු. 826,755,121 හා රු.1,081,453,938 ක් වූයෙන් වර්ෂයේදී සමූහයේ බදු පෙර ලාභය සියයට 14.7 කින් අඩු වී තිබුණි. ලංකා හොස්පිටල් ඩයග්නෝස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි දුර්වල කාර්යසාධනය මීට මූලික හේතුව වී තිබුණි.

2018 අප්‍රේල් 01 දින සිට බලපැවැත්වෙන ආදායම් බදු අනුපාත වෙනස්කම් හේතුවෙන් වූ රු.මිලියන 274 ක විලම්බිත බදු ගැලපීමෙහි ප්‍රතිඵලයක් ලෙස, සමාගම් මට්ටමින් බදු පෙර ආදායම සියයට එකකින් සුළු වශයෙන් වර්ධනය වී තිබුණු අතර සමූහයේ වර්ෂය සඳහා ලාභය සියයට 40.24 කින් අඩු වී තිබුණි. තවද, මව් සමාගමේ කොටස්කරුවන් හේතුවෙන් වන ලාභය රු.මිලියන 269 කින් හෙවත් සියයට 69 කින් අඩුවී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

## 3.2.1 මූල්‍ය ප්‍රතිඵලවල සාරාංශය

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා විවිධ අවස්ථාවල දී වූ මූල්‍ය ප්‍රතිඵලවල සාරාංශය පහත වගුව මගින් දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය | | | |
|---|---|---|---|---|
| | 2017 | | 2016 | |
| | රු. | | රු. | |
| | '000 | | '000 | |
| | සමාගම | සමූහය | සමාගම | සමූහය |
| ආදායම | 5,225,553 | 6,382,058 | 4,902,083 | 5,886,441 |
| සේවා පිරිවැය | (2,936,768) | (3,519,257) | (2,680,770) | (3,099,004) |
| දළ ලාභය | 2,288,785 | 2,862,801 | 2,221,313 | 2,787,437 |
| අනෙකුත් ආදායම් | 161,467 | 51,981 | 58,468 | 52,543 |
| පරිපාලන වියදම් | (1,232,814) | (1,549,695) | (1,116,309) | (1,379,607) |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | (539,116) | (636,519) | (502,043) | (561,752) |
| ආයෝජන දේපළවල සාධාරණ අගයෙහි වෙනස්කම් | 14,000 | - | 8,000 | - |
| මූල්‍ය ආදායම | 142,553 | 193,480 | 157,326 | 182,832 |
| බදු පෙර ලාභය | 834,875 | 922,048 | 826,755 | 1,081,453 |
| ආදායම් බදු වියදම | (304,604) | (341,197) | (93,371) | (109,429) |
| වර්ෂය සඳහා ලාභය | 530,271 | 580,851 | 733,384 | 972,024 |

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 බැංකු මුදල්

රු.48,418 ක් වූ නොවිසඳුනු බැංකු දෝෂ දීර්ඝ කාලයක සිට බැංකු සැසඳුම් ප්‍රකාශනවල ඇතුළත් කර තිබුණි.

### 4.2 එකතු කළ අගය මත බදු (VAT) වාර්තා සමඟ ආදායම් සැසඳීම

සමාගම විසින් මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන මුළු ආදායම සමග එකතු කළ අගය මත බදු (VAT) වාර්තාවල දැක්වෙන මුළු සැපයුම් සසඳා නොතිබුණි.

කෙසේ වුවද, ඇඳ කුලී හා වෘත්තීය ගාස්තු වශයෙන් එකතු කළ අගය මත බදු (VAT) වලට යටත් සැපයුම්වල සංරචක දෙකක් පැවතීම නිසා බව සමාගමෙහි සභාපතිවරයා දන්වා තිබුණි. නමුත් රෝහල් ආදායමින් ඇඳ කුලී පමණක් එකතු කළ අගය මත බදු සඳහා යටත් බව පිළිගත් කරුණකි. තවද, උපදේශන ගාස්තු රෝහල් ආදායමෙහි කොටසක් නොවන අතර රෝහල, වෛද්‍යවරයාගේ මෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් රැස්කරන්නා ලෙස කටයුතු කරයි. කෙසේ වුවද, එකතු කළ අගය මත බදු (VAT) වාර්තාවල මුළු සැපයුම් වටිනාකම ඇතුළත් කිරීමට සිදුව ඇති අතර, එබැවින් මුළු වෘත්තීය ගාස්තු ද සලකා බැලිය යුතු විය. ඇතැම් අවස්ථාවල උපදේශකවරුන් (උදා:- දන්ත වෛද්‍ය/ රැදවුම් ගාස්තු) සමඟ වූ ආදායම් සම්බන්ධ ගිවිසුම් පැවතීම හේතුවෙන් මෙම ප්‍රමාණයන් දෙක සැසඳීම ප්‍රායෝගික නොවේ. 2016 වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරන අවස්ථාවේ දී හා 2018 ජනවාරි 09 දින දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් හා පැවති පෞද්ගලික සෞඛ්‍ය සංගමයේ රැස්වීමේ දී දේශීය ආදායම් දෙපාර්තමේන්තුව මෙම කරුණ සම්බන්ධයෙන් එකඟව පිළිගෙන ඇත.

කෙසේ වුවද, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ වූ පිළිගැනීම හා ගිවිසුම තහවුරු කර ගැනීම සඳහා විගණන සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.